Media Society
Centre for Society and Religion (CSR),
281 Deans Road, Colombo 10.
0716 372757 / 0710 86 6060 /0773710807

ජනමාධ්‍ය සමාජය,
සමාජය හා සාමයික කේන්ද්‍රය,
281 ඩීන්ස් පාර, කොළඹ 10.
0716 372757 / 0710 86 6060 / 0773710807

MEDIA SOCIETY | ජනමාධ්‍ය සමාජය | மீடியா சொசைட்டி

2025 ජූලි 31

# ජාතික ජනමාධ්‍යය ප්‍රතිපත්තිය සැකසීම සඳහා යෝජනා

ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්ති කෙටුම්පත සම්පූර්ණයෙන් කියවා අධ්‍යයනය කළ පසු අපට හැඟී ගියේ එය බොහෝ දුරට රටේ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය භාවිතාව මූලික කරගෙන සැකසුණු එකක් බවත් එය තුළ 'විකල්ප මාධ්‍ය, නව මාධ්‍ය, සමාජ මාධ්‍ය ප්‍රමුඛ ඩිජිටල් මාධ්‍ය' සඳහා සැලකිය යුතු අවධානයක් වෙන්වී නැති බවයි.

එහිදී ප්‍රජා මාධ්‍ය භාවිතය, දුරකථනය පමණක් භාවිතයෙන් කරන MOJO මාධ්‍ය කලාව ප්‍රමුඛ ඩිජිටල් මාධ්‍ය භාවිතයටද සැලකිය යුතු අවධානයක් යොමු විය යුතු බව අපගේ හැඟීමයි.

මා ප්‍රමුඛ අප කණ්ඩායම නියෝජනය කරන සමාජය හා සාමයික කේන්ද්‍රය ඩිජිටල් මාධ්‍ය පුහුණුව සඳහා වසර 11 කට වැඩි කාලයක් සිට සිය ආයතනය හරහා වැඩ කරනු ලබන අතර ඒ හරහා අප MOJO වැඩමුළු 10 කට ආසන්න ප්‍රමාණයක්ද? youtube ප්‍රමුඛ සමාජ මාධ්‍ය භාවිතය සඳහා වැඩමුළු රැසක්ද වසරක් පාසා නොමිලේ නේවාසික මාධ්‍ය වැඩමුළු හරහා රට පුරා නවක මාධ්‍යවේදීන් හා ප්‍රජා මාධ්‍ය කණ්ඩායම් පුහුණු කිරීමේ කටයුතු රැසක්ද සිදු කර ඇත.

එසේම මේ වන විට මාධ්‍ය සංවිධාන 07 ක් ආරම්භ කිරීම සඳහා පුරෝගාමී දායකත්වය සපයා ඇති අතර ඒවා වසර ගණනාවක් පුරා පවත්වාගෙන යයි. නිදහස් මාධ්‍ය සංසදය, ජනමාධ්‍ය සාමූහිකය, තරුණ ක්‍රිස්තියානි ජනමාධ්‍යවේදීන්ගේ සංගමය, වතු කම්කරුවන්ගේ ප්‍රජා මාධ්‍ය සංසදය යන මාධ්‍ය සංවිධාන හා ඩිජිටල් මාධ්‍යය ප්‍රමුඛ වූ ''ශ්‍රී ලංකා යූ ටියුබ් නිර්මාණකරුවන්ගේ වෘත්තීය එකමුතුව'',''සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ගේ සංසදය'' හා ''MOJO Media Club'' දුරකථන මාධ්‍ය සමාජය කණ්ඩායම ද අප ආයතනය මූලිකව බිහි වූ සංවිධාන වේ. එසේම ලංකාවේ ජනමාධ්‍යය වෙනුවෙන් පළවන එකම සඟරාව වන''Media'' සඟරාව ප්‍රකාශයට පත් කරන්නේද අප කණ්ඩායම වේ.

එනිසාම ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ හා ඩිජිටල් මාධ්‍ය අවකාශයේ සියල්ලන් හා අවස්ථා කිහිපයක මුහුණට මුහුණ හමු වී හා Zoom තාක්ෂණය හරහා කළ සාකච්ඡා මගින් ලබාගත් අදහස් හා යෝජනා රැසක් මෙසේ ඉදිරිපත් කරමි.

## ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් හා බැඳුණු ප්‍රතිපත්ති සුරක්ෂණ යාන්ත්‍රණයක අවශ්‍යතාව.

ලොව පුරා විවිධ ජාතික ප්‍රතිපත්ති නිර්මාණය වී ඇති අතර ඒ ඇතැම් ඒවා කොලවල ලියැවුණු නමට පමණක් වූ ප්‍රතිපත්ති බවට පත්ව තිබේ. ජනතා අදහස් තුළින් නිර්මාණය කරන ජාතික ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාමට එකී ප්‍රතිපත්තියට සම්බන්ධ දැක්මක්, මෙහෙවරක්, අරමුණු, පදනමක්, අභිමතාර්ථ, සිද්ධාන්ත, විෂය පථයන් සඳහන්ව විග්‍රහ කර තිබුනද ඒ සියල්ල ක්‍රියාවලියක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාමට නම් යම් යාන්ත්‍රණයක් නිර්මාණය විය යුතුය. එම යාන්ත්‍රණය ප්‍රතිපත්ති කෙටුම්පතට පිටින් හෝ විවිධ අය ලබා දුන් අදහස් හා යෝජනා අනුසාරයෙන් යම් සැලැස්මක් හෝ යෝජනාවලියක් ලෙස ඉදිරිපත් කිරීමත් එයට අවශ්‍ය අවශේෂ අංශ සම්බන්ධයෙන් යම් විග්‍රහයක් තිබීමත් වැදගත්ය.

උදාහරණයක් ලෙස *ආචාරධර්ම පද්ධතියක් සැකසීමේ ක්‍රමවේදය, *මාධ්‍ය නියාමන කොමිසමක් ඇති කිරීමේදී එහි ආකෘතිය * හා ක්‍රමවේදයන් *. *දැන්වීම් නියාමන කොමිසමක්, *ස්වාධීන මාධ්‍ය කොමිසමක්, *විදුලිසංදේශ හා * දුරකථන නියාමන කොමිසමක් වැනි මෙම ක්‍රියාවලියටම බද්ධ වෙන වෙනත් ක්‍රියාවලියන් සැලැස්මක් ලෙස ප්‍රතිපත්ති කෙටුම්පතට පරිබාහිරව ඉදිරිපත් කිරීම.

**( ඇතැම් කරුණු අප යෝජනාවලියේදී පැහැදිලි කර ඇත) ***

## 1. ඩිජිටල් අවකාශය සඳහා වැඩි අවධානයක්

මෙම ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්ති කෙටුම්පත බොහෝ දුරට රටේ ප්‍රධාන ධාරාවේ මාධ්‍ය භාවිතාව මූලික කරගෙන සැකසුණු එකක් බව බැලූ බැල්මට පෙනෙන්නට තිබේ. ලෝකයම ඩිජිටල් වෙමින් තිබියදී අපේ රට ඉදිරියේදී මෙයට වඩා වේගවත්ව ඩිජිටල් අවකාශය තුළ ඉදිරියට යා යුතුවේ. එබැවින් ඩිජිටල් අවකාශය ප්‍රසාරණය සඳහා බලපානු ලබන තාක්ෂණික දැනුම හා මෙවලම් සම්බන්ධයෙන් මෙම ජාතික ප්‍රතිපත්තිය තුළ වඩා වැඩි ඉඩකින් කතා කළ යුතුයැයි අප යෝජනා කරමු.

### ● ඩිජිටල් නිර්මාණකරුවන් හා නිර්මාණකරණය

ඩිජිටල් අවකාශය තුළ ජනමාධ්‍යවේදීන් නොවන නමුත් විවිධ තොරතුරු සන්නිවේදනය කරන නිර්මාණශීලී සන්නිවේදකයින් සම්බන්ධයෙන් වඩා පුළුල් ලෙස ඇතුළත්ව තිබිය යුතුය. කිසිම ලෙසකින්වත් ලෝකය හා අප යා කරන ඩිජිටල් අවකාශය සීමා කිරීමකට ජාතික මාධ්‍ය ප්‍රතිපත්තියක් තුළ නොයා යුතුය. එහිදී ඩිජිටල් මාධ්‍යවේදීන් හා මාධ්‍යවේදීන් නොවන ඩිජිටල් නිර්මාණකරුවන් සම්බන්ධයෙන් යම් පැහැදිලි නිර්වචනයක් හා විග්‍රහයක් මෙහි තිබීමද, ඔවුන්ගේ කාර්යභාරයන් සහ තාක්ෂණයන් සම්බන්ධයෙන් යම් තක්සේරුවක් කිරීමද වැදගත්ය.

### ● ඩිජිටල් MOJO මාධ්‍යවේදීන් හා නිර්මාණකරුවන්

ලංකාවේ මේ වන විට අති බහුතරයක් තොරතුරු හුවමාරුව සඳහා භාවිතා කරනු ලබන්නේ ජංගම දුරකථනයයි. එනිසාම වෘත්තීය මට්ටමේ වීඩියෝ කැමරා හෝ නිශ්චල ඡායාරූප කැමරා භාවිතයෙන් තොරතුරු වාර්තාකරණයට සිදු කරනවාට වඩා අද වන විට වඩා පහසු, සැහැල්ලු හා ලාභදායී ලෙස දුරකථන භාවිතයෙන් තොරතුරු වාර්තාකරණය, නිර්මාණකරනය හා තොරතුරු ලබා ගැනීම සිදු කළ හැකිය. එබැවින් රට පුරා ඩිජිටල් නිර්මාණකරුවන් හා ප්‍රවෘත්ති වාර්තාකරුවන් මේ වන විට සුලබ ලෙස ජංගම දුරකථනය භාවිතා කරනු ලබයි. එබැවින් ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් තුළ රට තුළ තොරතුරු ලබා ගැනීමටත්, තොරතුරු බෙදා හැරීමටත් භාවිතා වන ජංගම දුරකථන භාවිතයට විශේෂ අවධානයක් දීම වැදගත්වේ. එයින්ද MOJO නිර්මාණකරනය සම්බන්ධ ජාතික වැඩපිළිවෙළක් සැදීම වැදගත්ය.

### ● ප්‍රජා ජනමාධ්‍යකරණය

ලංකාව තුළ විවිධ ප්‍රජාවන් නියෝජනය කරනු ලබන කොටස් මේ වනවිට තම ප්‍රජාවගේ ගැටළු සාකච්ඡා කිරීමත් එකී ගැටළු ජනගත කර විසඳුම් ලබා ගැනීමටත් හැකි සාර්ථක භාවිතයක් ලෙස ප්‍රජා ජනමාධ්‍යකරණය සලකයි. ගොවි ප්‍රජාව, ධීවර ප්‍රජාව, කම්කරු ප්‍රජාව, අත්කම් නිර්මාණ ප්‍රජාව, ඇඟළුම් සේවක ප්‍රජාව, වතු ප්‍රජාව, කාන්තා ප්‍රජා කණ්ඩායම්, පාසැල් දරුවන් මේ අතර වේ. එසේ ප්‍රජා මාධ්‍යකරණය මගින් සිය ප්‍රජාවගේ ගැටළු තමන්ටම කතා කිරීමට හැකිවන පරිදි පුහුණු කරන රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සංවිධාන රැසක් වේ. අද මෙම ප්‍රජා මාධ්‍යකරණය සීග්‍රයෙන් ව්‍යාප්තවෙමින් පවතී. එබැවින් ප්‍රධාන ධාරාවේ මාධ්‍යය මෙන්ම ප්‍රජා මාධ්‍යකරණයටද රටේ ජනමාධ්‍ය ප්‍රතිපත්තියක සැලකිය යුතු අවධානයක් යොමු විය යුතු යැයි අපි යෝජනා කරමු.

### ● ඩිජිටල් ව්‍යාවසායකයින් සඳහා ජාතික වැඩපිළිවෙළක් සැකසීම

අද වන විට ඩිජිටල් අලෙවිකරණය. ප්‍රචාරණය හා ප්‍රවර්ධනය හරහා රට තුළ විශාල ව්‍යාවසායකයින් ප්‍රමාණයක් බිහිව ඇත. ජාතික ජනමාධ්‍යය ප්‍රතිපත්තියක් සැකසීමට පෙර සමීක්ෂණයක් මගින් ඒ සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් කර අවබෝධයක් ලැබීම වැදගත් යැයි අපි යෝජනා කරමු. එහිදී ඔවුන් සුරක්ෂණය වන වැඩපිළිවෙලක් සැකසීම සඳහා රජයට යම් සැලැස්මක් තිබීම වැදගත් වේ.

### ● ඩිජිටල් නිර්මාණකරුවන් හරහා විදේශ විනිමය ලබා ගැනීමේ ජාතික වැඩපිළිවෙලක්

අද වන විට ඩිජිටල් නිර්මාණකරුවන් විසින් ඉතා අවම ආයෝජනයන්ගෙන් වැඩි විදේශ විනිමයක් දේශීය ආර්ථිකයට ලබා දෙමින් සිටී. Youtube, Facebook, Tik Tok වැනි සන්නිවේදන ප්‍රවාහයන් හරහා ඔවුන් රටට අවශ්‍ය විදේශ විනිමය මිලියන ගණනක් ලබා දෙමින් සිටී. නමුත් මේ දක්වා කිසිදු රජයක් මෙම ඩිජිටල් නිර්මාණකරුවන් විධිමත්ව පුහුණු කර ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කර නැත. (නමුත් අප ආයතනය වසරක් පාසා ඔවුන් නොමිලේ පුහුණු කිරීමේ වැඩසටහන් රැසක් කරමින් සිටී). එසේම මේ වන විට රජය විසින් අසාධාරණ ලෙස ඔවුන් මත 18% ක බද්දක්ද පනවා ඇත. නමුත් අප යෝජනා කරන්නේ රටට විදේශ විනිමය ලබාදෙන ඔවුන් මත බදු පටවා ඔවුන් අධෛර්යවත් නොකර ඔවුන්ට විධිමත් පුහුණුව මගින් **Local Contents** වෙනුවට **International Contents** සැකසීමට පුහුණු කර බදු සහන ඇතිව මාධ්‍ය උපකරණ ලබා ගැනීමට සලස්වා ලංකාවේ ඩිජිටල් නිර්මාණකරුවන්ගේ ප්‍රමාණය තවත් 200% හෝ වැඩි කළ හැකි නම් රටට මේ ලැබෙන විදේශ විනිමයද තවත් 200% කින් වැඩිකර ගත හැකි බවයි. ඒ සඳහා රජය පුළුල් අවබෝධයක් ලබාගෙන ජාතික වැඩපිළිවෙලක් * සැකසිය යුතුය.

## 2. ඩිජිටල් අවකාශය සඳහා අන්තර්ජාල හා දුරකථන පහසුකම් පුළුල් කිරීම

• ප්‍රධාන ධාරාවේ මාධ්‍ය මෙන්ම සමාජ මාධ්‍ය හා නව මාධ්‍ය සඳහාද ප්‍රමුඛතාව හා රාජ්‍ය අනුග්‍රහය ලබාදී ඩිජිටල් අවකාශය පුළුල් කිරීමේ වැඩසටහනක් රජය විසින් ආරම්භ කළ යුතුවේ. සෑම පුරවැසියෙකුටම තොරතුරු දැනගැනීමේ හා තොරතුරු බෙදාහැරීමේ අයිතිය මූලික අයිතිවාසිකමක් සේ සලකමින්, වේගවත් හා ලාභදායී අන්තර්ජාල සේවාවක් ලබාගැනීම දිවයිනේ සෑම ප්‍රදේශයකම සිටින සෑම පුරවැසියෙකුටම ලැබිය යුතු බව ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්ති තුළ මූලිකත්වයෙන් පිළිගත යුතුය. මේ යටතේ පාරිභෝගිකයන් රවටා නොමඟ යවන, අදාළ දුරකථන සේවා පොරොන්දු වූ පරිදි ලබා නොදෙමින් පාරිභෝගිකයන් ගසාකන දුරකථන සමාගම් වලට එරෙහිව යම් *"**දුරකථන නියාමන පනත**" ක් ඇති කිරීම හා පනතේ ප්‍රකාර පාරිභෝගිකයන් හට සිය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීමට හැකියාව ලබා දීම.

• මුළු රටම ආවරණය වන පරිදි දුරකථන කුළුණු ඇති කිරීමට දුරකථන සමාගම් සඳහා යම් රාජ්‍යමය බලපෑමක් කිරීම හෝ සියළු දුරකථන සමාගම් සතු සන්නිවේදන කුළුණු රජයට පවරාගෙන, ආවරණයන් නැති කලාප සඳහා රජය මැදිහත් වී සන්නිවේදන කුළුණු ඉදිකර ඒවා දුරකථන සමාගම් සඳහා බදුදීම මෙයට විසඳුමකි.

## 3. දැන්වීම් නියාමනයක් ඇති කිරීම

ජනමාධ්‍ය හා සමාජ මාධ්‍යය හරහා දැන්වීම් මගින් පාරිභෝගිකයින් රැවටීම, නොමඟ යැවීම, බලපෑම් කිරීම, ව්‍යාජ හා සාවද්‍ය කරුණු හරහා පෙළඹවීම්, පාරිභෝගිකයින්ට නුසුදුසු භාණ්ඩ අලෙවිය වැනි සියල්ල විධිමත්ව නියාමනය කිරීමට ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්තියේ කොටසක් බවට පත්කර එයට සම්බන්ධ කර *"**දැන්වීම් නියාමන කොමිසමක්**" ඇති කිරීම. **Digital Marketing / Online Sales** සම්බන්ධයෙන් අලෙවි හා දැන්වීම් විධිමත් නියාමනයකට ලක් කිරීම.

## 4. මාධයවේදීන්ගේ සුරක්ෂිතභාවය / ආරක්ෂාව හා වගවීම

මාධ්‍යවේදීන්ගේ ශාරීරික හා මානසික ආරක්ෂාව සඳහා විධිමත් වැඩපිළිවෙලක් ඇති කිරීම. එය හරහා මාධයවේදීන්ට පහරදීම්, හිරිහැරකිරීම් හා අනීතික අත් අඩංගුවට ගැනීම් වලදී ඔවුන්ට ප්‍රමුඛත්වය ලබා දී යුක්තිය ඉටු කිරීමේ කඩිනම් වැඩපිළිවෙලක් ඇති කිරීම.

**⋆ දශක ගණනාවක් පුරා මරා දැමූ, අතුරුදහන් කළ, පහරදුන්, බියවැද්දීම් සිදු කළ, අනීතික ලෙස අත් අඩංගුවට ගත් සියළු මාධ්‍යවේදීන් වෙනුවෙන් යුක්තිය ලබාදිය හැකි "බලතල සහිත කොමිසමක්" පත් කිරීම.**

⋆ ජනමාධ්‍යවේදීන්ගේ පවුල් සම්බන්ධයෙන් සුබසාධන වැඩසටහනක් ඇරඹීම.

⋆ ජනමාධ්‍යවේදීන්ගේ පැමිණිලි සඳහා විශේෂ පොලිස් සම්බන්ධීකරණ ඒකකයක් පිහිටුවීම. (මෙය 2015 වසරේ මා ලේකම්ධුරය දැරූ මාධ්‍ය සංවිධාන එකතුවක් වන ''මාධ්‍ය නිදහස සඳහා ක්‍රියාකාරී කමිටුව' විසින් සාර්ථකව කරගෙන යනු ලැබීය).

⋆ මාධ්‍ය හා නව මාධ්‍ය උපකරණ, මුද්‍රණ කඩදාසි හා තීන්ත වැනි මාධ්‍ය උපකරණ සහන මිළට ලබා දීමේ වැඩපිළිවෙළක් ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් තුළ ඇතුළත් කළ යුතුයැයි අප යෝජනා කරමු.

⋆ සියලු මාධ්‍ය හා සමාජ මාධ්‍ය සංවිධාන ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම.

සියළු ජනමාධ්‍ය සංවිධාන ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විධිමත්ව ලියාපදිංචි කිරීමට සැලැස්වීම හා ඒ මගින් වාර්ෂිකව ජනමාධ්‍ය අමාත්‍යාංශය සියලු මාධ්‍යවේදීන්ට හා මාධ්‍ය සංවිධාන වලට වැඩ කටයුතු කිරිමට යම් ප්‍රතිපාදනයක් වෙන් කිරීම. රජයෙන් ලබාදෙන ප්‍රතිපාදන ජනමාධ්‍ය සංවිධානය හරහා ලබාදීම. ජනමාධ්‍ය සම්බන්ධ රජයේ තීන්දු තීරණ වලදී හා නිර්මාණය කරන නියාමන කොමිසම් හෝ පනත් වලදී සියලු ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය සංවිධාන දැනුවත් කිරීම හා අනිවාර්යෙන් ඔවුන්ගේ අදහස් කැමැත්ත ලබා ගනිමින් සම්බන්ධ කර ගැනීම. ජනමාධ්‍යවේදීන්ගේ පුහුණුව සඳහා වාර්ෂිකව මුදලක් වෙන්කර ඒවා මාධ්‍ය සංවිධාන සඳහා වාර්ෂිකව ලබාදීම.

## 5. බුද්ධිමය දේපල අයිතීන් ආරක්ෂා කිරීම හා විෂමතාවන් නැති කිරීම

බුද්ධිමය දේපල සුරක්ෂිත කිරීම කිරීම මෙන්ම අන්තර්ජාල පලකිරීම් වලදී බාධාවන් ඉවත් කිරීම හා බුද්ධිමය දේපල විෂමතාවයන් ඉවත් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම.

## 6. මාධ්‍ය මර්ධන නීති හා පනත් ඉවත් කිරීම

ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්තියකට මාධ්‍ය සමාජයේ සියල්ලන් එක්වීමට නම් පළමුව සියළු ජනමාධ්‍ය සංගම් හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් එකග නැති,

- **මාර්ගගත සුරක්ෂණ පනත**
- **විද්‍යුත් විකාශන අධිකාරී පනත**

ඉවත් කළ යුතු අතර ඉන්පසු යම් පොදු මාධ්‍ය නියාමන කොමිසමක් සඳහා සියළු ජනමාධ්‍ය සංගම් හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් හා පොදු මාධ්‍ය සමාජයේ එකඟතාවයකින් යුතු කොමිසමක් සකස් කරගත හැකිය.

⋆ **(ජාතික ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සඳහා අපේ සහාය හා එකඟතාවය ලැබෙන්නේ රජය විසින් ඉහත සඳහන් මාධ්‍ය මර්ධන පනත් දෙක අහෝසි කර දැමුවහොත් පමණකි.)**

## 7. ජනමාධ්‍යයේ හා ඩිජිටල් අවකාශයේ ස්වාධීන බව/ අපක්ෂපාතීත්වය / මධ්‍යස්ථ බව ආරක්ෂා කිරීම

මේ සඳහා රජයේ හෝ රජය කරවන පක්ෂයට සම්බන්ධ දේශපාලන පත් කිරීම් නොකර ***''ස්වාධීන මාධ්‍ය කොමිසම''**ක් හරහා රාජ්‍ය මාධ්‍ය පත්වීම්, රජය විසින් පත් කරන සියළු කොමිසම් සඳහා පත් කිරීම් සිදු කිරීමත් ඒ සියල්ල නිරීක්ෂණය සඳහා ජනමාධ්‍ය සමාජය නියෝජනය කරන පුළුල් * ''**ස්වාධීන මාධ්‍ය නිරීක්ෂණ කමිටුවක්**'' පත් කරමින් එහි නිර්දේශ ගැඹුරින් සලකා බැලීමත් අත්‍යාවශ්‍ය කාරණයකි.

**• තොරතුරු දැනගැනීමේ පනතට දේශපාලන මුහුණුවරක් නොදී, එය අඩාල කර දිය කරනු වෙනුවට, එය වඩා බලාත්මක කිරීමටත්, ප්‍රබල කිරීමටත් කටයුතු කරමින් ජාතික ජනමාධ්‍ය ප්‍රත්පත්තියක් තුළ තොරතුරු දැනගැනීමේ පනත අත්‍යවශ්‍ය ප්‍රබල කාරණාවක් බවට පත් කළ යුතුය.***

## 8. ජනමාධ්‍ය වෘත්තීමයභාවයක් ඇති කිරීම.

⋆ මාධ්‍යවේදීන් සහ ප්‍රවෘත්ති මාධ්‍යවේදීන් සඳහා අනිවාර්‍ය පිළිගත් විභාග ක්‍රමයක් * ඇතිකිරීම
එයට සාපේක්ෂව වැටුප්තල ඇති කිරීම.

⋆ මාධ්‍යය වෘත්තියේ පූර්ණකාලීනව හා අර්ධකාලීන්ව යෙදෙන ප්‍රාදේශීය මාධ්‍යවේදීන්, නිදහස් මාධ්‍යවේදීන්, වෙබ් මාධ්‍යවේදීන් ප්‍රමුඛ ඩිජිටල් මාධ්‍යවේදීන්ටද අර්ථසාධක ප්‍රමුඛ ප්‍රතිලාභ ක්‍රමයක් * ඇති කිරීම.

⋆ මාධ්‍යවේදීන් සඳහා හැඳුණුම්පත් ලබාදීම ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලියාපදිංචි වූ මාධ්‍ය සංවිධාන සඳහා පැවරීම.

ස්තුතියි.
මෙයට,

**මාධ්‍යවේදී තිළිණ අලහකෝන්.**
කැඳවුම්කරු,
ජනමාධ්‍ය සමාජය
**0716 372757**
**thilinaalahakoon@gmail.com**



1. Free Media Forum - නිදහස් මාධ්‍ය සංසදය
2. Media Collective - ජනමාධ්‍ය සාමූහිකය
3. Young Christian Journalists Association - තරුණ ක්‍රිස්තියානි ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
4. Sri Lanka Professional Youtube Vloggerlists Association - ශ්‍රී ලංකා යූ ටියුබ් නිර්මාණකරුවන්ගේ වෘත්තීය එකමුතුව
5. Plantation Workers' Community Media Forum - වතු කම්කරුවන්ගේ ප්‍රජා මාධ්‍ය සංසදය
6. Social Media Activists Forum - සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන්ගේ සංසදය
7. MOJO Media Club - දුරකථන මාධ්‍ය සමාජය